# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2096/68 - 2018 නොවැම්බර් මස 09 වැනි සිකුරාදා - 2018.11.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 වැනි ව්‍යවස්ථාව යටතේ පත්කරන ලද අමාත්‍යවරුන් සඳහා පවරනු ලබන විෂයයන් හා කාර්යයන් සහ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන නිශ්චය කර ඇති හෙයින් ;

එකී අමාත්‍යවරයන් භාරයේ පවත්නා විෂයයන්, කාර්යයන්, දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන මෙම නිවේදනයේ දිනයේ සිට මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි පරිදි පවත්නා බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2018 නොවැම්බර් මස 09 වැනි දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

**උපලේඛනය**

**(1) රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා අධිකරණ අමාත්‍ය**

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, අධිකරණ, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා පාර්ලිමේන්තු කටයුතු විෂයයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන් හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
2. ඩිස්ටන්ස් ලර්නිං සෙන්ටර් ලිමිටඩ්
3. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
4. රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාර අරමුදල
5. ජාතික එලදායිතා ලේකම් කාර්යාලය
6. සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති හා අණ පනත්*

- අනිවාර්ය රාජ්‍ය සේවා පනත (1961 අංක 70)
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පනත (1982 අංක 9)
- වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් පනත (1983 අංක 24)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය (සම්බන්ධිතයි)*

(1) රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා අධිකරණ අමාත්‍ය *(සම්බන්ධිතයි)*

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

2. පහත සඳහන් සේවාවන්හි පරිපාලනය හා පිරිස් කළමනාකරණය
   - ශ්‍රී ලංකා පරිපාලන සේවය
   - ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය
   - ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය
   - ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය
   - ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය
   - ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය
   - ශ්‍රී ලංකා තාක්ෂණ සේවය
3. ඒකාබද්ධ සේවා පරිපාලනය කිරීම
4. ආයතන සංග්‍රහය යටතේ වන කාර්යයන්
5. රාජ්‍ය සේවා පුහුණුව
6. ජාතික ඵලදායීතාවය ඉහළ නැංවීම පිණිස ප්‍රතිපත්ති, වැඩසටහන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
7. විශ්‍රාම වැටුප් සංග්‍රහය ක්‍රියාත්මක කිරීම
8. රජයේ සියලුම විශ්‍රාම වැටුප් ක්‍රම සම්බන්ධ කටයුතු
9. අපේක්ෂිත සංවර්ධන ඉලක්කයන් සාක්ෂාත් කරගැනීම පිණිස රාජ්‍ය තන්ත්‍රය තුළ යහපාලනය ප්‍රවර්ධනය කිරීම
10. නවීන යහපාලන සංකල්ප හඳුන්වා දීම
11. ජනතා අපේක්ෂාවන්ට මුල්තැන ලබාදෙන රාජ්‍ය සේවයක් නිර්මාණය කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම
12. රාජ්‍ය උත්සව සංවිධානය කිරීම

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

7. සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල
8. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
9. නීතිපති දෙපාර්තමේන්තුව
10. නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව
11. ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව
12. රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
13. ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් කාර්යාලය
14. ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාව
15. උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය
16. ශ්‍රී ලංකා නීති ආධාර කොමිසම
17. සමථ මණ්ඩල කොමිෂන් සභාව
18. නීති අධ්‍යාපන සභාව
19. මහා භාරකාර දෙපාර්තමේන්තුව
20. ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය
21. ශ්‍රී ලංකා ඉන්ටර්නැෂනල් ආර්බිට්‍රේෂන් සෙන්ටර් (ගරන්ටි) ලිමිටඩ්
22. බන්ධනාගාර දෙපාර්තමේන්තුව
23. ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව
24. තරුණ විශෝධන පුහුණු පාසැල

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ආඥාපනත (1898 අංක 1)
- වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම (සන්නද්ධ හමුදා) පනත (1998 අංක 60)
- වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම (සන්නද්ධ හමුදා) පනත (1970 අංක 18)
- රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාර අරමුදල පනත (1999 අංක 40)
- රජයේ නිවාස (සන්තකය ආපසු ලබාගැනීම) පනත (1969 අංක 7)
- රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල ආඥාපනත (1942 අංක 18)
- තෑගි පිරිනැමීමේ තරග පනත (1957 අංක 37)
- බලතල පැවරීමේ (ප්‍රාදේශීය ලේකම්වරයන්) පනත (1992 අංක 58)
- උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනත (1951 අංක 17)
- උඩරට විවාහ හා දික්කසාද පනත (1952 අංක 44)
- මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (1951 අංක 13)
- නොතාරිස් ආඥාපනත (1907 අංක 1)
- ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත (1927 අංක 23)
- සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනත (1907 අංක 19)
- නිවාඩු පනත (1971 අංක 29)
- උපරිමාධිකරණ සංකීර්ණය කළමනාකරණ මණ්ඩලය පනත (1987 අංක 50)
- ජාත්‍යන්තර ළමා පැහැරගෙන යාම පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ සම්මුතිය පනත (2001 අංක 10)
- නීති අධ්‍යාපන මණ්ඩල සභා පනත (1974 අංක 6)

*උපලේඛනය (සම්බන්ධිතයි)*

(1) රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා අධිකරණ අමාත්‍ය *(සම්බන්ධිතයි)*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |

13. ග්‍රාම රාජ්‍ය කේන්ද්‍රයන්හි සීමා නිර්ණය කිරීම
14. ග්‍රාම රාජ්‍ය කේන්ද්‍ර මණ්ඩලය පිහිටුවීම
15. දිස්ත්‍රික් සංවර්ධන සම්බන්ධීකරණ මණ්ඩලය පිහිටුවීම
16. උපත්, විවාහ හා මරණ ලියාපදිංචියට අදාළ කටයුතු
17. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් වෙනත් කිසිවෙකු වෙත පවරාදෙනු නොලැබූ යුක්තිය පසිඳලීමේ අධිකරණයන්හි පරිපාලනය පිළිබඳ කටයුතු
18. සමාජ අවශ්‍යතාවන් සහ ගෝලීය ප්‍රවණතාවන් සැලකිල්ලට ගෙන නීති පද්ධතියට අවශ්‍ය කරනු ලබන ප්‍රතිසංස්කරණ සිදුකිරීම
19. උසාවි පද්ධතිය තුළ යුක්තිය පසිඳලීමේ ප්‍රමාදයන් වැළැක්වීම ඇතුලු සමස්ත පරිපාලනයට අදාළ සියලු කටයුතු ක්‍රමවත්ව කාර්යක්ෂමව ඉටුකිරීම
20. රජය වෙනුවෙන් අපරාධ නඩු පැවරුම් හා සිවිල් නීති කටයුතු
21. රජයට සහ සියලුම රජයේ දෙපාර්තමේන්තුවලට නීති උපදෙස් ලබාදීම
22. නීති කෙටුම්පත් කිරීම
23. යම් වරදකරුවකුට නියම කරනු ලැබූ දඬුවම් සම්බන්ධයෙන් සමාව දීම, අඩු කිරීම, ලිහිල් කිරීම, ප්‍රමාද කිරීම හා අත්හිටුවීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම
24. සමස්ත ක්වාසි පද්ධතියේ ඵලදායීතාව හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීම පිණිස සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම
25. කම්කරු විනිශ්වය සභා පරිපාලනය සහ ඊට අදාළ අනෙකුත් කටයුතු

- ණය සහන සභා ආඥාපනත (1941 අංක 39)
- විදේශ නඩු තීන්දු බලාත්මක කිරීමේ ආඥාපනත (1956 අංක 15)
- ආණ්ඩුවේ රස පරීක්ෂක (භාණ්ඩ බැහැර කිරීමේ) පනත (1988 අංක 69)
- පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනත (1990 අංක 19)
- සමායතන නීතිඥ ආයතන නීතිය (1978 අංක 33)
- අධිකරණ සංවිධාන පනත (1978 අංක 2)
- උසාවි භාෂා පනත (1961 අංක 3)
- නීති කොමිෂන් සභා පනත (1969 අංක 3)
- නීති ආධාර පනත (1978 අංක 11)
- සමථ මණ්ඩල පනත (1988 අංක 72)
- වංචා වැළැක්වීමේ ආඥාපනත (1840 අංක 7)
- සමාජ අබලතා වැළැක්වීමේ පනත (1957 අංක 21)
- ප්‍රාථමික අධිකරණ සංවිධාන පනත (1979 අංක 44)
- රාජ්‍ය (සිවිල් වරදෙහිලා වගකීම්) පනත (1969 අංක 22)
- අපරාධ වැළැක්වීමේ ආඥාපනත (1926 අංක 2)
- ක්වාසි අධිකරණ (පත්වීම් වලංගු කිරීමේ) පනත
- මහා භාරකාර ආඥාපනත (1922 අංක 01)
- අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත (2015 අංක 4)
- ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය පනත (2000 අංක 44)
- බන්ධනාගාර ආඥාපනත (1877 අංක 16)

**උපලේඛනය** *(සම්බන්ධිතයි)*

**(1) රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා අධිකරණ අමාත්‍ය** *(සම්බන්ධිතයි)*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
| 26. නීතිය නැවත ලේඛනගත කිරීම හා සංග්‍රහගත කිරීම | | ■ තරුණ වරදකරුවන් (පුහුණු පාසැල්) පනත (1939 අංක 28) |
| 27. අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතට (2015 අංක 4) අදාළ සියලුම කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම | | ■ වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිත පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |
| 28. බන්ධනාගාර ප්‍රතිසංස්කරණයට අදාළ ප්‍රතිපත්ති, සැළසුම් හා වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම | | |
| 29. බන්ධනාගාර පරිපාලනය හා ප්‍රතිසංස්කරණය | | |
| 30. ප්‍රජා පාදක විශෝධන ව්‍යාපෘති සම්බන්ධ කටයුතු | | |
| 31. පාර්ලිමේන්තුවට සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කටයුතුවලට අදාළව රජය විසින් ඉටු කළයුතු කාර්යයන් | | |
| 32. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ආයතනික සහ විනය කරුණු සම්බන්ධ සම්බන්ධීකරණ කටයුතු | | |
| 33. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කාර්ය මණ්ඩලවලට සම්බන්ධ ආයතනික කටයුතු | | |
| 34. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සුභසාධන කටයුතු | | |
| 35. පාර්ලිමේන්තු අධීක්ෂණ ප්‍රතිසංස්කරණ වලට අදාළ කටයුතු | | |
| 36. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු | | |
| 37. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**(2) අන්තර්ජාතික වෙළෙඳාම සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය**

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. අන්තර්ජාතික වෙළෙඳාම සහ ආයෝජන ප්‍රවර්ධන විෂයයට අදාළව II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තුවට හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති පිළියෙල කිරීම
3. ශ්‍රී ලංකාව තුළ ආර්ථික විභවතාව ප්‍රවර්ධනය කරමින් විදේශීය සෘජු ආයෝජන සහ පුද්ගලික අංශයේ ආයෝජන ප්‍රවර්ධනය කිරීම
4. දේශීය නිෂ්පාදනයන් සඳහා ජාත්‍යන්තර වෙළෙඳපොළ අවස්ථා පුළුල් කිරීම සඳහා ක්‍රමෝපායන් සැකසීම
5. ජාත්‍යන්තර වෙළෙඳ සබඳතා ශක්තිමත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම
6. කලාපීය ආර්ථික සහයෝගීතාවය ඉහළ නැංවීම අරමුණු කර ගත් ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය
7. බහුපාර්ශවික සහ ද්විපාර්ශවික ආර්ථික සම්මුතීන් සම්බන්ධ කටයුතු
8. ආර්ථික සංවර්ධන කළාප ප්‍රවර්ධනය, නියාමනය සහ අධීක්ෂණය
9. අපනයන විවිධාංගීකරණය, දිරි ගැන්වීම, අපනයන සංවර්ධනය හා උපදේශන සේවා ක්‍රියාත්මක කිරීම
10. විදේශයන්හී ශ්‍රී ලංකා වෙළෙඳ කටයුතු නියෝජනය කිරීම
11. වෙළෙඳ ප්‍රදර්ශන පැවැත්වීම
12. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු
13. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
2. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
3. ආනයන හා අපනයන දෙපාර්තමේන්තුව
4. වාණිජ දෙපාර්තමේන්තුව

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා නීතිය (ආයෝජන මණ්ඩලය නීතිය) (1978 අංක 4)
- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත (1979 අංක 40)
- ආනයන හා අපනයන පනත (1969 අංක 1)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**(3) නිවාස හා සමාජ සුබසාධන අමාත්‍ය**

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. නිවාස, සමාජ සුබසාධන හා සමාජ සවිබලගැන්වීම් විෂයයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන රජයේ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතනයන් හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. රජයේ නිල නිවාස සහ අනෙකුත් ගොඩනැගිලි සඳහා ප්‍රමිති හා ප්‍රතිමාන නියම කිරීම
3. අඩු ආදායම්ලාභීන් සහ විශේෂිත ප්‍රජා කණ්ඩායම්ද ඇතුලුව මහජනතාවගේ නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා නිවාස යෝජනා ක්‍රම සහ නිවාස මූල්‍යාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
4. පරිසර හිතකාමී ලෙස වියදමට සරිලන ප්‍රතිලාභ ගෙන දෙන නිවාස තැනීමේ තාක්ෂණ ක්‍රම ගැන ග්‍රාමීය ජනතාවට මඟපෙන්වීම
5. ප්‍රධාන වශයෙන් රජයේ ආයතනවලට යාන්ත්‍රික ඉංජිනේරු සේවා සැපයීම
6. අදාළ නීති රීති හා ප්‍රමිතීන්වලට අනුව ඉදිකිරීම් කර්මාන්ත ක්ෂේත්‍රයේ කටයුතු නියාමනය, ලියාපදිංචි කිරීම, විධිමත් කිරීම සහ ප්‍රමිතිකරණය
7. ඉදිකිරීම් කර්මාන්තයට උපදේශන හා නියාමන සේවා සැපයීම සහ බර ඉදිකිරීම් උපකරණ ක්‍රියාත්මක කරවීම හා නඩත්තු පිළිබඳ පුහුණුව
8. සහාධිපත්‍ය දේපළ කළමනාකරණය සහ නියාමන කටයුතු
9. මහජන සහාධිපත්‍ය ප්‍රතිසංස්කරණය කිරීම සහ කාර්යක්ෂම සහ කඩිනම් ලෙස නිවාසවල අයිතිය පැවරීම
10. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ දුබලතාවන් හඳුනාගැනීම හා පුනරුත්ථාපනය සිදුකිරීම
11. මහජන ආධාර යෝජනා ක්‍රමය සමාලෝචනය කිරීම, ප්‍රතිසංවිධානය හා උචිත නව ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම
12. ක්ෂය රෝගීන්ට, වකුගඩු රෝගීන්ට, ලාදුරු රෝගීන්ට, පිළිකා සහ තැලසීමියා රෝගීන්ට සහ ඔවුන්ගෙන් යැපෙන්නන්ට ආධාර ලබාදීම

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
2. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
3. සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය (පොදු පහසුකම් මණ්ඩලය)
4. නිවාස සැලසුම් සහ ගොඩනැගිලි මධ්‍යස්ථානය
5. ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව
6. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
7. රජයේ කර්මාන්ත ශාලාව
8. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
9. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
10. රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව
11. සීමාසහිත ඩෙව්කො ෂෝවා පුද්ගලික සමාගම
12. ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය
13. නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව
14. සමාජ සේවා දෙපාර්තමේන්තුව
15. වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය
16. ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහලේකම් කාර්යාලය
17. ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික සභාව
18. ජාතික සමාජ සංවර්ධන ආයතනය
19. දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
20. ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනය
21. සමාජ ආරක්ෂණ මණ්ඩලය

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති හා අණ පනත්*

- ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත (1979 අංක 17)
- නාගරික ජනාවාස සංවර්ධන අධිකාරී පනත (2008 අංක 36)
- බද්ධ නිවාස අයිතිවාසිකම් පනත (1973 අංක 11)
- බද්ධ නිවාස අයිතිවාසිකම් (විශේෂ විධිවිධාන) පනත (1999 අංක 4)
- පොදු පහසුකම් මණ්ඩල පනත (1973 අංක 10)
- ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත (2014 අංක 33)
- නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව පනත (1997 අංක 7)
- නිවර්තන නිවාස ආඥාපනත (1907 අංක 5)
- දරිද්‍රතා නීති ආඥා පනත (1939 අංක 30)
- වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත (2000 අංක 9)
- ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත (1996 අංක 28)
- අයාල ආඥාපනත (1841 අංක 4)
- දෘෂ්‍යාබාධිතයන් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල් පනත (1992 අංක 9)
- ජාතික සමාජ සංවර්ධන ආයතනය පනත (1992 අංක 41)
- දිවි නැගුම පනත (2013 අංක 1)
- දිළිඳු සහන පනත (1985 අංක 32)
- සමාජ ආරක්ෂණ මණ්ඩල පනත (1996 අංක 17)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

*උපලේඛනය (සම්බන්ධිතයි)*

(3) නිවාස හා සමාජ සුබසාධන අමාත්‍ය *(සම්බන්ධිතයි)*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති හා අණ පනත්* |
| 13. පවුල් උපදේශන සේවා ක්‍රියාත්මක කිරීම | | |
| 14. ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීමට හා රැකියා අවස්ථා ඇති කරලීමට අවශ්‍ය ක්‍රමෝපායන් සැලසීම | | |
| 15. ආබාධිතයන් සඳහා සමාජ රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම | | |
| 16. වයෝවෘද්ධ තැනැත්තන් රැකබලා ගැනීම, සමාජ සංවර්ධන කාර්යයන්හි වැඩිහිටියන්ගේ සහභාගීත්වය ඉහළ නැංවීම සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරැකීමට අවශ්‍ය පියවර ගැනීම | | |
| 17. ග්‍රාමීය ජනදිවිය සවිබල ගැන්වීම පිණිස ක්‍රමෝපායන් හඳුන්වා දීම හා ඒවා ක්‍රියාත්මක කිරීමට මූල්‍යාධාර සම්පාදනය කිරීම | | |
| 18. ග්‍රාමීය සහ ප්‍රාදේශීය ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදනය කිරීම | | |
| 19. ග්‍රාමීය ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | | |
| 20. දිවිනැගුම වැඩසටහන ක්‍රියාත්මක කිරීම | | |
| 21. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු | | |
| 22. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

(4) බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍ය

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති හා අණ පනත්* |
| 1. බුද්ධශාසන, ආගමික කටයුතු, තරුණ, කාන්තා හා ළමා කටයුතු විෂයයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තුවෙහි සහ ව්‍යවස්ථාපිත ආයතනයන්හි ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම | 1. බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | ■ බුද්ධ ශාසන අරමුදල පනත (1990 අංක 35) |
| 2. සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැගීම සඳහා ආගමික වටිනාකම් ජනතාව තුළ වර්ධනය කරනු පිණිස ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම | 2. බුද්ධ ශාසන අරමුදල | ■ විහාර දේවාලගම් ආඥාපනත (1931 අංක 19) |
| | 3. ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථාන | ■ ගෘහස්ථ හිංසනය වැළැක්වීමේ පනත (2005 අංක 34) |
| | 4. ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය | ■ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත (1998 අංක 50) |
| | 5. කාන්තාවන් පිළිබඳ ජාතික කමිටුව | ■ ළමයින් දරුකමට හදා ගැනීමේ ආඥාපනත (1941 අංක 24) |
| | 6. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | ■ ළමයින් සහ තරුණ තැනැත්තන් පිළිබඳ ආඥාපනත (1939 අංක 48) |
| | 7. ජාතික ළමාරක්ෂක අධිකාරිය | |
| | 8. ළමා ලේකම් කාර්යාලය | |
| | 9. ජාතික තරුණ සේවා සභාව | |
| | 10. ජාතික යොවුන් සේනාංකය | |
| | 11. ජාතික යෞවන තිළිණ ප්‍රදාන අධිකාරිය | |

උපලේඛනය *(සම්බන්ධිතයි)*

(4) බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍ය *(සම්බන්ධිතයි)*

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

3. බුදුදහම සුරක්ෂිත කොට පෝෂණය කිරීම හා ප්‍රවර්ධනය උදෙසා යෝග්‍ය වැඩසටහන් හා ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම
4. බුද්ධ ශාසනය සුරක්ෂිතකොට පෝෂණය කිරීම උදෙසා යෝග්‍ය වැඩසටහන් හා ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම
5. බුදුදහම සම්බන්ධයෙන් වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම
6. පූජා භූමි සැළසුම්කරණය හා සංවර්ධනය කිරීම
7. උත්තරීතර අනුශාසක මණ්ඩලයේ අවශ්‍යතා ඉටුකිරීම
8. අන්තර්ජාතික වශයෙන් ථෙරවාද බුදුදහම ප්‍රචාරය කිරීම සඳහා කටයුතු කිරීම
9. නේපාලයේ පිහිටි ශ්‍රී ලංකාවට වෙන්කර දී ඇති ලුම්බිනි පූජා භූමිය සංවර්ධනය කිරීමේ කටයුතු
10. කාන්තාවන්ගේ ජීවිතයේ ගුණාත්මක අගය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
11. රාජ්‍ය කටයුතුවලදී තීරණ ගැනීම සහ දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තාවන්ගේ සහභාගීත්වය සහ නියෝජනය වැඩි කිරීම සඳහා ක්‍රමෝපායන් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම
12. ගැටුම්වලින් හා දරිද්‍රතාවයෙන් විපතට පත් කණ්ඩායම් විශේෂයෙන් අරමුණු කර ගනිමින් කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සාධාරණත්වය ඇතිකිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම
13. කාන්තා හා ළමා හිංසනය වැළැක්වීම සඳහා නීති හා ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම හා ක්‍රියාත්මක කිරීම
14. කාන්තා මූලික ගෘහ ඒකක සවිබල ගැන්වීම සඳහා ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම
15. තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉටුකර ගැනීම
16. කාන්තා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

12. සී/ස ජාතික තරුණ සේවා සමූපකාරය
13. නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති හා අණ පනත්*

- ජාතික තරුණ සේවා සභා පනත (1979 අංක 69)
- යොවුන් සේනාංක පනත (2002 අංක 21)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

උපලේඛනය *(සම්බන්ධිතයි)*

(4) බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍ය *(සම්බන්ධිතයි)*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති හා අණ පනත්* |
| 17. ශාරීරික හා මානසික වශයෙන් නීරෝගී දරුවෙකු ඇති කරලීමේ අභිප්‍රායෙන් මුල් ළමා විය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය කිරීම, පළාත් මට්ටමේ කමිටු සමඟ සම්බන්ධීකරණය, සමායෝජනය සහ පසු විපරම් කිරීම | | |
| 18. අනාරක්ෂිත තත්ත්වයේ සිටින දරුවන්ගේ අයිතිවාසිකම්, ජාතික ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර සම්මතයන්ට ගැලපෙන සේ උසස් මට්ටමට පමුණුවා, සමාන අවස්ථා සලසාදෙනු පිණිස සැලසුම්, වැඩසටහන් හා ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාත්මක කිරීම | | |
| 19. ළමා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම | | |
| 20. ළමා සුරැකුම් මධ්‍යස්ථාන නියාමනය කිරීම | | |
| 21. සෙවන සරණ කැපකරු මව්පිය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම | | |
| 22. තරුණ පරපුර නිවැරදි දිශානතියකට යොමුකිරීම අරමුණු කරගත් ආකල්ප සංවර්ධන වැඩසටහන් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම | | |
| 23. තරුණ පරපුර කේන්ද්‍ර කරගත් අන්තර්ජාතික සහයෝගිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | |
| 24. රැකියා විරහිත තරුණයින් කේන්ද්‍ර කොටගත් කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | |
| 25. තරුණයින් සවිබල ගැන්වීම සහ තරුණ සංවිධාන සම්බන්ධ කටයුතු | | |
| 26. තරුණ ප්‍රජාව ඉලක්ක කරගත් ස්වේච්ඡා වැඩසටහන් සම්පාදනය | | |
| 27. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු | | |
| 28. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**(5) තැපැල් හා විදුලි සංදේශ අමාත්‍ය**

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. තැපැල් හා විදුලි සංදේශ විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තුවල විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. දේශීය හා විදේශීය තැපැල් සේවා කටයුතු
3. නවතම තාක්ෂණය සහ කළමනාකරණ ක්‍රමවේදයන් භාවිත කරමින් විවිධත්වය තුලින් ව්‍යාපාර අරමුණු කරගත් නවීන තැපැල් සේවයක් ලබාදීම සහ එය කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම
4. වෙනත් දෙපාර්තමේන්තු සඳහා නියෝජිත ගෙවීම් කටයුතු සිදු කිරීම
5. ලංකා මුද්දර කාර්යාංශය පරිපාලනය කිරීම
6. නවීන තාක්ෂණය යොදාගනිමින් සැමට විදුලි සංදේශ පහසුකම් ලබාදීමට අවශ්‍ය පියවර ගැනීම
7. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු
8. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. තැපැල් දෙපාර්තමේන්තුව
2. ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම හා එහි පාලිත සමාගම් සහ ආශ්‍රිත ආයතන
3. විදුලි සංදේශ දෙපාර්තමේන්තුව (ඇවර කරමින් පවතී)

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති හා අණ පනත්*

- මුද්දර ආඥාපනත (1909 අංක 22)
- තැපැල් කාර්යාල ආඥාපනත (1908 අංක 11)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

**(6) කම්කරු, විදේශ රැකියා හා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍ය**

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. කම්කරු, විදේශ රැකියා හා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන විෂයයන්ට සහ IIවැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන්, සේවක පරිපාලනය සහ සුභසාධනය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස්කිරීම සහ ක්‍රියාත්මක කිරීම

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. කම්කරු දෙපාර්තමේන්තුව
2. ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය
3. සේවක අර්ථසාධක අරමුදල
4. ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය
5. කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය
6. ශ්‍රම වාසනා අරමුදල
7. මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව
8. සීමාසහිත ශ්‍රී ලංකා රැකියා පියස
9. සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල
10. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති හා අණ පනත්*

- සේවක මණ්ඩල පනත (1979 අංක 32)
- සේවක අර්ථසාධක අරමුදල් පනත (1958 අංක 15)
- ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීමේ පනත (1956 අංක 47)
- කර්මාන්ත ශාලා ආඥාපනත (1942 අංක 45)
- කාර්මික ආරවුල් පනත (1950 අංක 43)
- ප්‍රසූතිකාධාර ආඥාපනත (1939 අංක 32)
- ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත (2009 අංක 38)

උපලේඛනය *(සම්බන්ධිතයි)*

**(6) කම්කරු, විදේශ රැකියා හා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍ය** *(සම්බන්ධිතයි)*

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

3. ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ ජාත්‍යන්තර සමාජ ආරක්ෂණ සංවිධානය සමග අන්තර් සහයෝගිතාව පවත්වා ගැනීම
4. සේවක අර්ථසාධක අරමුදල, පෞද්ගලික අර්ථසාධක අරමුදල සහ පෞද්ගලික විශ්‍රාම ගැන්වීමේ ක්‍රම පරිපාලනය කිරීම
5. කාර්මික සබඳතා සහ කාර්මික ආරවුල් නිරාකරණය කිරීම
6. කම්කරු සබඳතාවලට අදාළ නීතිරීති සම්පාදනය සහ නියාමනයට අදාළ කටයුතු
7. වෘත්තීය සහ රැකියා මාර්ගෝපදේශ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
8. වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම සහ රාජ්‍ය සහ පෞද්ගලික අංශවල සියලු වෘත්තීය සමිතිවල කටයුතු රටේ සංවර්ධනයට යොදාගැනීම සඳහා අවශ්‍ය සාධනීය පියවරයන් හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම
9. ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
10. රැකියා නියුක්ති ආයතන විසින් ගාස්තු අයකිරීම නියාමනය කිරීම
11. විරැකියා ප්‍රතිලාභ රක්ෂණ යෝජනා ක්‍රමයට අදාළ කටයුතු
12. වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
13. සංක්‍රමණික සේවා නියුක්තිකයින්ගේ වෘත්තියමය ගැටළුවලට පිළියම් ලබාදීම සහ සුබසාධනය ඉහළ දැමීම
14. විදේශගත ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා නව නීති හඳුන්වාදීම
15. රැකියා නියෝජිතායන නියාමනය සහ අධීක්ෂණය කිරීම
16. විදේශ රැකියා සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය සැපයීම
17. ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන හා ස්වභාවික ගෑස් ආනයනය කිරීම, පිරිපහදුව, ගබඩා කිරීම, බෙදාහැරීම සහ අලෙවි කිරීම
18. ඛනිජ තෙල් නිෂ්පාදනය සහ පිරිපහදුව සම්බන්ධ කටයුතු
19. ඛනිජ තෙල් ගවේෂණය හා ඒ ආශ්‍රිත කටයුතු

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

11. ශ්‍රී ලංකා විදේශ රැකියා නියෝජිතායතනය
12. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
13. සීමාසහිත ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්තය
14. ඛනිජ තෙල් සම්පත් සංවර්ධන කාර්යාංශය
15. සීමාසහිත පොලිප්ටෝ ලංකා (පුද්ගලික) සමාගම

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති හා අණ පනත්*

- පාරිතෝෂික ගෙවීම් පනත (1983 අංක 12)
- සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත (1954 අංක 19)
- ශ්‍රම වාසනා අරමුදල් පනත (1998 අංක 12)
- කම්කරුවන්ගේ සේවා නියුක්තිය අවසන් කිරීම (විශේෂ විධිවිධාන) පනත (1971 අංක 45)
- වෘත්තීය සමිති ආඥාපනත (1935 අංක 14)
- පඩිපාලක සභා ආඥාපනත (1941 අංක 27)
- කම්කරු වන්දි ආඥාපනත (1934 අංක 19)
- ගාස්තු අය කිරීමේ රැකියා නියුක්ති නියෝජිතායතන පනත (1956 අංක 37)
- සේවා නියුක්තයින්ගේ භාර අරමුදල (විශේෂ විධිවිධාන) පනත (1993 අංක 19)
- සේවා නියුක්තයින්ගේ භාර අරමුදල පනත (1980 අංක 46)
- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනත (1985 අංක 21)
- විදේශ රැකියා නියෝජිතායතන පනත (1980 අංක 32)
- ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත (1961 අංක 28)
- ඛනිජ තෙල් සම්පත් සංවර්ධන පනත (2003 අංක 26)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිත පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**(6) කම්කරු, විදේශ රැකියා හා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍ය** *(සම්බන්ධිතයි)*

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති හා අණ පනත්* |
|---|---|---|
| 20. ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රභවයන්ගෙන් ගෑස් නිෂ්පාදනය හා බෙදාහැරීම<br>21. ඉන්ධන සැපයීම හා බෙදාහැරීමට අදාළ වන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම<br>22. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>23. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

**(7) කර්මාන්ත හා වාණිජ අමාත්‍ය**

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. කර්මාන්ත හා වාණිජ විෂයයට හා II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. කර්මාන්ත ප්‍රවර්ධනය සහ සංවර්ධනය
3. ශ්‍රී ලංකාවේ හස්ත කර්මාන්ත නිෂ්පාදනය සඳහා මෝස්තර සංවර්ධනය හා ප්‍රචලිත කිරීම
4. රාජ්‍ය ව්‍යවසාය ක්ෂේත්‍රය තුළ නව දැනුම හා තාක්ෂණය හඳුන්වාදීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම
5. රාජ්‍ය ව්‍යවසායයන්හි නිෂ්පාදිතයන්ගේ ප්‍රමිතිය හා ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
6. ව්‍යවසායකත්වය, ජාතික ආර්ථික ප්‍රවාහය හා බද්ධ කිරීමට ක්‍රමෝපායන් සැකසීම
7. ඵලදායී සම්පත් උපයෝජනය තුළින් දේශීය ව්‍යවසායයන් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා යොදා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම
8. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු
9. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. ශ්‍රී ලංකා පේෂ කර්මාන්ත හා ඇඟලුම් ආයතනය
2. පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව
3. කහටගහ ග්‍රැෆයිට්
4. ලංකා ලේලන්ඩ් ලිමිටඩ්
5. ලංකා අශෝක් ලේලන්ඩ් ලිමිටඩ්
6. සීමාසහිත ලංකා සිමෙන්ති සමාගම
7. ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව
8. මාන්තායි සෝල්ට් ලිමිටඩ්
9. අලිමංකඩ ලුනුලේවාය
10. ලංකා ටෙක්ස්ටයිල් මිල්ස් එම්පෝරියම් ලිමිටඩ්
11. ලංකා සළුසල ලිමිටඩ්
12. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය
13. ජාතික ශිල්ප සභාව
14. ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල)
15. ජාතික මෝස්තර මධ්‍යස්ථානය
16. කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය ප්‍රාග්ධන සමාගම
17. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අධිකාරිය
18. සීමාසහිත ජාතික කඩදාසි සංස්ථාව
19. ලංකා ඛනිජ වැලි සමාගම
20. පරන්තන් කෙමිකල්ස් ලිමිටඩ්
21. බෝගල ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්
22. ලංකා පිඟන් සංස්ථාව (ගඩොල් සහ උළු අංශය)
23. සීමාසහිත කහගොල්ල ඉංජිනේරු සේවා සමාගම (KESCO)
24. සීමාසහිත බී.සී.සී. සමාගම

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති හා අණ පනත්*

- ජාතික ශිල්ප සභා සහ අනුබද්ධ ආයතන පනත (1982 අංක 35)
- ජාතික ශිල්ප සභා සහ අනුබද්ධ ආයතන (විශේෂ විධිවිධාන) පනත (1996 අංක 4)
- ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනත (2006 අංක 17)
- ශ්‍රී ලංකා පේෂ කර්මාන්ත හා ඇඟලුම් ආයතන පනත (2009 අංක 12)
- රෙදිපිළි පංගු මණ්ඩල පනත (1996 අංක 33)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

*උපලේඛනය (සම්බන්ධිතයි)*

(8) වැවිලි කර්මාන්ත අමාත්‍ය

### *I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. වැවිලි කර්මාන්ත විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. වැවිලි බෝගවල ඵලදාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය සානුබල සහ අනෙකුත් පහසුකම් සැලසීම
3. වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ ඵලදායීතාවය සඳහා අන්තර්ජාතික තරගකාරිත්වය ඉහළ නැංවීම
4. වැවිලි බෝග මත පදනම් වූ එකතුකළ වටිනාකම වැඩිකිරීම සම්බන්ධ කර්මාන්ත නගා සිටුවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
5. තේ හා රබර් සම්බන්ධ බලපත්‍ර නිකුත් කිරීම
6. තේ අපනයනය සඳහා අවසර පත්‍ර නිකුත් කිරීම
7. තේ හා රබර් වතු කැබලි කිරීම සම්බන්ධව බලපත්‍ර නිකුත් කිරීම සහ පාලනය කිරීම
8. බහුබෝග වගාවන් සහ සංගත ගොවිපල ක්‍රම තුළින් වැවිලි ඉඩම් ප්‍රශස්ථ මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම සහ එමගින් නිෂ්පාදනය හා සේවා නියුක්තිය වැඩිකරලීම
9. තේ, රබර් සහ පොල් කර්මාන්ත සංවර්ධනය, ප්‍රවර්ධනය සහ පර්යේෂණයන්ට අදාළ කටයුතු
10. සීනි කර්මාන්තයට අදාළ රාජ්‍ය සම්පත් කළමනාකරණය හා සුරැකීම
11. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු
12. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම

### *II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
2. ජාතික වැවිලි කළමනාකරණ ආයතනය
3. ශ්‍රී ලංකා තේ මණ්ඩලය
4. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
5. තේ හා රබර් වතු (පාලනය කිරීමේ හා කැබලි කිරීමේ) මණ්ඩලය
6. තේ ශක්ති අරමුදල
7. තුරුසවිය අරමුදල
8. තේ පර්යේෂණ ආයතනය
9. රබර් පර්යේෂණ ආයතනය
10. පොල් වගා කිරීමේ මණ්ඩලය
11. පොල් සංවර්ධන අධිකාරිය
12. පොල් පර්යේෂණ ආයතනය
13. සීමාසහිත කළුබෝවිටියන තේ කර්මාන්ත ශාලාව
14. ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන සහ අපනයන සංස්ථාව
15. ජනතා වතු සංවර්ධන මණ්ඩලය
16. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
17. සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම
18. සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම
19. සීමාසහිත හලාවත වැවිලි සමාගම
20. ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම
21. ශ්‍රී ලංකා කජු සංස්ථාව
22. සීමාසහිත හිඟුරාන සීනි කර්මාන්ත සමාගම
23. සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම සහ එයට අනුබද්ධ සෙවණගල සීනි කර්මාන්ත ශාලාව සහ පැල්වත්ත සීනි කර්මාන්ත ශාලාව
24. කන්තලේ සීනි සමාගම
25. උක් පර්යේෂණ ආයතනය

### *III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති හා අණ පනත්*

- ජාතික වැවිලි කළමනාකරණ ආයතනය පනත (1979 අංක 45)
- ලංකා තේ මණ්ඩලය පනත (1970 අංක 15)
- රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත (1953 අංක 36)
- රබර් පර්යේෂණ මණ්ඩල ආඥාපනත (1930 අංක 10)
- රබර් පාලන පනත (1956 අංක 11)
- තේ (බදු හා අපනයන පාලනය) පනත (1959 අංක 16)
- තේ හා රබර් වතු (කැබලි කිරීම් පාලනය කිරීම) පනත (1958 අංක 2)
- තේ පාලන පනත(1957 අංක 51)
- තේ ශක්ති අරමුදල පනත (2000 අංක 47)
- කුඩා තේ වතු සංවර්ධන පනත (1975 අංක 35)
- තේ ආධාර මුදල් පනත (1958 අංක 12)
- තුරුසවිය අරමුදල් පනත (2000 අංක 23)
- තේ පර්යේෂණ මණ්ඩල පනත (1993 අංක 52)
- පොල් වගාකිරීමේ මණ්ඩල පනත (1971 අංක 46)
- පොල් සංවර්ධන පනත (විශේෂ විධිවිධාන) (1984 අංක 45)
- පොල් සංවර්ධන පනත (1971 අංක 46)
- කොහු කෙඳි පනත (1967 අංක 17)
- පොල් නිෂ්පාදන ආඥාපනත (1935 අංක 13)
- පොල් පර්යේෂණ මණ්ඩල පනත (1950 අංක 37)
- උක් පර්යේෂණ ආයතන පනත (1981 අංක 75)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**(9) නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍ය**

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. නගර සැලසුම්, ජලසම්පාදන හා මුස්ලිම් ආගමික කටයුතු විෂයයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. විශේෂ නගර සැලසුම්කරණය හා සංවර්ධනය
3. නාගරික සංවර්ධන කාර්යයන් ඉටු කිරීම සඳහා ජාතික භෞතික සැලසුම් පදනම් කරගෙන සියලු ඉදිකිරීම් කටයුතු මෙහෙයවීම හා ක්‍රියාත්මක කිරීම
4. සෑම පුරවැසියෙකුටම පිරිසිදු පානීය ජලය ලබාදීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය වන ක්‍රියාමාර්ග ගැනීම
5. ජලසම්පාදන සේවා, ජලාපවහන පද්ධති සහ සනීපාරක්ෂක පහසුකම් විමර්ශනය කිරීම, සැලසුම් කිරීම, නිර්මාණය කිරීම, ඉදිකිරීම, මෙහෙයවීම හා නඩත්තු කිරීම
6. ප්‍රජා ජලසම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘති කාර්යක්ෂමව සහ විධිමත්ව ඉටුකිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
7. සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැගීම සඳහා ආගමික වටිනාකම් ජනතාව තුළ වර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම
8. මුස්ලිම් ආගමික කටයුතු සම්බන්ධයෙන් වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම
9. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු
10. II තීරුවෙහි දැක්වෙන ආයතන අධීක්ෂණය කිරීම

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය
2. ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව
3. මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති හා අණ පනත්*

- ජාතික ජලසම්පාදන සහ ජලාපවහන මණ්ඩල පනත (1974 අංක 2)
- මුස්ලිම් පල්ලි සහ මුස්ලිම් පුණ්‍යාධාර භාරයන් හෝ වකුෆ් පනත (1956 අංක 51)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**(10) වෙළෙඳ, පාරිභෝගික, සමුපකාර සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය**

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. වෙළෙඳ, පාරිභෝගික, සමුපකාර සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික විෂයයට හා II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැගීම සඳහා ආගමික වටිනාකම් ජනතාව තුළ වර්ධනය කරනු පිණිස ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
3. ක්‍රිස්තියානි ආගමික කටයුතු සම්බන්ධයෙන් වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම
4. දේශීය වෙළෙඳපොල තුළ පාරිභෝගික භාණ්ඩ ගුණාත්මක මට්ටමෙන් හා හිඟයකින් තොරව සාධාරණ මිලකට සැපයීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම
5. 1949 අංක 6 දරන උකස් පනතෙහි 114 වැනි වගන්තිය යටතේ ණය දෙන ආයතන අනුමත කිරීම
6. පාරිභෝගික භාණ්ඩවලට අදාළ වන ජාතික මිළ ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාවෙහි යෙදවීම
7. පාරිභෝගික ආරක්ෂණය සඳහා ක්‍රියාමාර්ග ගැනීම
8. බුද්ධිමය දේපල පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය පරිපාලනය කිරීමට අදාළ කාර්යයන්හි ප්‍රකාශන අයිතිය හා ජගත් බුද්ධිමය දේපල කාර්යාලයෙහි ප්‍රකාශන අයිතිය සම්බන්ධ කටයුතු
9. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු
10. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව
2. සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
3. ශ්‍රී ලංකා බුද්ධිමය දේපල කාර්යාලය
4. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
5. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
6. සීමාසහිත ලංකා සතොස
7. සීමාසහිත ලංකා ජෙනරල් ට්‍රේඩිං සමාගම
8. සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව
9. මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව
10. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (සමුපකාර සමිති ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්)
11. සමුපකාර සේවක කොමිෂන් සභාව
12. අභ්‍යන්තර වෙළෙඳ දෙපාර්තමේන්තුව
13. ජාතික සමුපකාර සංවර්ධන ආයතනය

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති හා අණ පනත්*

- ව්‍යාපාර නාම පනත (1987 අංක 7)
- සමාගම් පනත (2007 අංක 7)
- බුද්ධිමය දේපල පනත (2003 අංක 36)
- වෙළෙඳ සළකුණු පනත (1964 අංක 30)
- සීට්ටු ආඥාපනත (1935 අංක 61)
- පොදු කොන්ත්‍රාත් පනත (1987 අංක 3)
- පාරිභෝගික කටයුතු අධිකාරි පනත (2003 අංක 9)
- පාරිභෝගිකයා ආරක්ෂා කිරීමේ පනත (1979 අංක 1)
- සමුපකාර තොග වෙළෙඳ සංස්ථා පනත (1949 අංක 44)
- සමුපකාර සේවක කොමිෂන් සභා පනත (1972 අංක 12)
- සමුපකාර සමිති පනත (1972 අංක 5)
- වෙළෙඳුන්ට බලපත්‍ර දීමේ පනත (1961 අංක 62)
- මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා පනත (1995 අංක 35)
- ජාතික සමුපකාර සංවර්ධන ආයතන (සංස්ථාගත කිරීමේ) පනත (2001 අංක 1)
- ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත (1980 අංක 41)
- කිරුම් හා මිනුම් ආඥාපනත (1946 අංක 37)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.